රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

RGD/AB/01/24/01/0001

234/A3, Denzil Kobbekaduwa Mawatha, Battaramulla

P. O. Box No. 565

Date 2026.08.06

අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්,

ප්‍රධාන කාර්යාලයේ සියළුම අංශ භාර මාණ්ඩලික නිලධාරීන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

කලාප භාර නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

ලේඛනාගාරය භාර නියෝජ්‍ය/සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්,

දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන්,

සියළුම ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

## ඒකාබද්ධ සේවාවන්හි නිලධාරීන්ගේ වාර්ෂික ස්ථාන මාරු - 2027

ඉහත කරුණ සම්බන්ධ ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නිකුත් කරන ලද අංක **COM/Trans/V/වා.ස්.මා/2027** හා **2026.07.31** දිනැති අංක **04/2026** දරණ ඒකාබද්ධ සේවා චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි. (මේ සඳහා රාජ්‍ය පරිපාලන,පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ www.pubad.gov.lk වෙබ් අඩවිය බලන්න.)

02. එහි සඳහන් විධිවිධාන අනුව 2027 වර්ෂයේ වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ යටතේ සිටින ඒකාබද්ධ සේවයේ නිලධාරීන්ගෙන් ස්ථාන මාරු අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව 2027 වර්ෂයේ කළමණාකරන සේවා නිලධාරි සේවය (I,II,III ශ්‍රේණි), තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය (2,3 පන්ති) , සංවර්ධන නිලධාරි සේවය , රියදුරු සේවය , කාර්යාල සේවක සේවය යන සේවා වලට අයත් වන නිලධරයන් මාර්ගගත ක්‍රමයෙන් **http://misco.pubad.gov.lk/misco** යන වෙබ් ලිපිනයට පිවිස වාර්ෂික ස්ථාන මාරු මාර්ගගත මෘදුකාංගය හරහා මාර්ගගත අයදුම්පතක් (online application) මඟින් ඉල්ලුම් කළ යුතුව ඇති බව කාරුණිකව දන්වමි.

03. ඔබ කාර්යාලයේ සේවයේ නියුතු නිලධරයන් විසින් මාර්ගගත ක්‍රමය ඔස්සේ තම සේවා විස්තර නිවැරදිව යාවත්කාලීන කර ඇත්ද යන්න තහවුරු කර ගැනීමෙන් අනතුරුව නිලධරයාගේ ස්ථාන මාරු ඉල්ලීම ඔබ විසින් නිර්දේශ කල යුතු අතර එම ස්ථාන මාරු අයදුම්පතෙහි මුද්‍රිත පිටපතක් (printout) ස්ථාන මාරුව අයදුම් කරන නිලධරයා විසින් අත්සන් කොට ඔබගේ නිර්දේශය සහිතව 2026.08.14 දිනට ප්‍රථම ( එම අයදුම්පත් සියල්ල 2025.08.17 දිනට ප්‍රථම ඒකාබද්ධ සේවා අංශය වෙත යොමු කළ යුතුව ඇති බැවින්) ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් සම්බන්ධයෙන් වගකියනු නොලබන බවද දන්වා සිටිමි.

04. ප්‍රාදේශීය ලේකම් කාර්යාවල රෙජිස්ට්‍රාර් අංශයේ සේවයේ නියුතු සංවර්ධන නිලධාරීන් විසින් තම ස්ථාන මාරු අයදුම්පත් ඉදිරිපත් කිරීමේදී වර්තමාන සේවා ස්ථානය ලෙස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව යටතේ අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තෝරා දැක්විය යුතුය.

CamScanner

05. ඒකාබද්ධ රියදුරු සේවයේ හා කාර්යාල සේවක සේවයේ නිලධාරීන්ට මාර්ගගත ක්‍රමය ඔස්සේ පෞද්ගලිකව අයදුම් කිරීම අපහසු වේ නම් තම සේවා ස්ථානය තුළින් එය සිදු කළ හැක. ඒ සඳහා අදාළ පහසුකම් ලබාදීමට ආයතන ප්‍රධානීන් විසින් ක්‍රියා කළ යුතුය.

06. පෙර සේවා තොරතුරු මෙතෙක් යාවත්කාලීන නොකළ නිලධරයන් තම පෞද්ගලික MISCO ගිණුම ඔස්සේ පිවිස තම දත්ත යාවත්කාලීන කළ යුතු අතර නිලධරයා විසින් තමන් ලද වාර්ෂික ස්ථාන මාරුව හා සාමාන්‍ය ස්ථාන මාරු පිළිබඳ සේවා තොරතුරුද යාවත්කාලීන කළ යුතුවේ.

**07. තවද එක් නිලධාරියෙකුට මාර්ගගත ක්‍රමය ඔස්සේ එක් අයදුම්පත්‍රයක් පමණක් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිමි.**

08. එමෙන්ම කාර්යාලයන්හි රඳවා ගැනීමට අවශ්‍ය නිලධාරීන් සහ වෛද්‍ය සහතික මගින් සනාථ කර ඇති බරපතල රෝගාබාධ වලින් පෙලෙන ස්ථාන මාරු නොකල යුතු නිලධාරීන් සම්බන්ධයෙන් කාර්යාල ප්‍රධානීන් විසින් පුද්ගලිකවම සනාථ කල යුතු වන අතර එහි නාම ලේඛනයක් 2026.08.12 දිනට පෙර මා වෙත ලැබීමට සලස් වන ලෙසද දන්වා සිටිමි. ඉහත කරුණු සම්බන්ධයෙන් වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලබන බව දන්වමි.

09. සෑම නිලධරයෙක් පිළිබඳවම නිවැරදි හා සම්පූර්ණ තොරතුරු සැපයීමට කාර්යාල ප්‍රධානීන් විසින් වග බලා ගත යුතු අතර සාවද්‍ය අසම්පූර්ණ තොරතුරු සපයා ඇති බව හෙළි වුවහොත් ඒ පිළිබඳ කාර්යාල ප්‍රධානීන් හා එම ලැයිස්තු සකස් කළ හා හරි වැරදි බලන ලද නිලධරයන් වගකීමට බැඳී සිටින බව දන්වමි.

10. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 2310/29 හා 2022.12.14 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ කාර්ය පටිපාටික රීති(කාණ්ඩ අංක 1) හි XVIII පරිච්ඡේදයේ විධිවිධාන හා ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව වාර්ෂික ස්ථාන මාරු සම්බන්ධව කටයුතු සිදු කෙරෙන බැවින් මෙම ක්‍රියාවලියේදී එම විධිවිධානයන්ට අනුකූලව කටයුතු කරන මෙන් දන්වා සිටිමි.

එච්.පී.චන්ද්‍රලාල්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
රෙජිස්ට්‍රාර් ජනරාල් වෙනුවට
දුරකථන : 0112 - 072038
ෆැක්ස් : 0112 - 889493
විද්‍යුත් ලිපිනය : sdrg@rgd.gov.lk

එච්.පී. චන්ද්‍රලාල්
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල් (පාලන)
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
අංක. 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

CamScanner